
**පරිණාමය**




# චාර්ල්ස් ඩාවින්ට එරෙහි නඩු විභාගය

**ආර්. බී. අතපත්තු**

'වානර නීතිය' නමින් ව්‍යවහාර වන්නට වූ අමෙරිකාවේ ආකන්සාස් ජනපදයේ 'රොටෙන්බෙරි පනත' ව්‍යවස්ථා විරෝධී එකක් හැටියට ප්‍රකාශ කරන ලෙසට අයැදිමින් එම ජනපදයේ ම තරුණ ගුරුවරියක වූ සුසාන් එපර්සන් මහාධිකරණයේ පවරා තුබූ නඩුව 1968 ඔක්තෝබර් මාසයේ 16 වැනිද අවසන් විණ. 'ප්‍රාථමික සත්ව විශේෂයකින් මිනිසා පැවත එන බව' පාසල්වල හෝ විද්‍යාලවල හෝ ඉගැන්වීම මෙම පනතින් තහනම් කොට තිබුණේ ය. එනම් ලෝක ප්‍රකට චාර්ල්ස් ඩාවින් ගේ පරිණාම වාදය පාසල් විෂය මාලාවෙන් ඉවත් කොට, එය අනාගත පරපුරට දැනගන්නට ඉඩ නොතැබීම මෙම පනතේ අරමුණ විය.

සුසාන් එපර්සන් වෙනුවෙන් පෙනී සිටියේ ඉයුජින් වොරන් නම් නීතිවේදියා ය. 'ඉගැන්වීම' යන්න පනතේ නිර්වචනය කොට නැති බවට මූලික විරෝධතා ප්‍රශ්නයක් මතු කළ ඔහු එය දෙවිධියකින් අර්ථකථනය කළ හැකි බවට තර්ක කළේ ය. ඉගැන්වීම යනු යම්කිසි මතවාදයකට හැරවීම මෙන් ම අදහසක් වශයෙන් යම් දෙයක යථාර්ථය පෙන්වාදීම ද අදහස් විය හැකි යැයි තර්ක කළ ඔහු 'වානර නීතිය' පැනවූ මෙම පනතින් අදහස් කරනුයේ මින් කොයික දැයි ප්‍රශ්න කොට සිටියේ ය. එසේ ම පාඩමකින් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට කියාදෙන මතයක් අනිවාර්යයෙන් ම ඔවුන් පිළිගත යුතු යැයි අධ්‍යාපනයෙන් අදහස් නොකෙරෙන බව ද අවධාරණය කෙළේ ය.

තවදුරටත් තර්ක කළ නීතිවේදියා ආකන්සාස් ජනපදයේ පාසල් බහුතරයක 'Modern Biology' (නව ජීව විද්‍යාව) නම් ග්‍රන්ථය පරිශීලනය කරන බවත්, එහි පරිණාමය පිළිබඳ මතවාදය අන්තර්ගත බවත් පෙන්වා දී එම කොටස් ඉගැන්වීමේ දී හමුවන විට 'මේ කොටස් ඉගැන්වීම අපට තහනම්' යනුවෙන් සිය ශිෂ්‍ය ශිෂ්‍යාවන් කීමට ගුරුවරු ගුරුවරියන්ට සිදු වී ඇති හෙයින් එය අතිශයින් ඛේදජනක තත්ත්වයක් බවත් කියා සිටියේ ය.

පරිණාමවාදය පාසල්වල ඉගැන්වීම නොහොබිනා දෙයක් නම් පරිණාමය පිළිබඳ ශබ්ද කෝෂවල මෙන් ම විශ්ව කෝෂවල ද ඇති ඒ පිළිබඳ වචන සහ යෙදුම් පෙරළා බැලීම ද ඒ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට තහනම් දෙයක් වන සැටි පෙන්වා දුන්නේ ය.

මේ අයුරින් අධිකරණ ශාලාවේ රැස්ව සිටි ප්‍රේක්ෂකයන් තුළ උනන්දුව ඇතිකරමින් ද, පරිණාමවාදය පිළිබඳ ව පුළුල් ප්‍රචාරයක් දෙමින් ද සිය දේශනය කළ මෙම නීතිවේදියා රජය වෙනුවෙන් පෙනී සිටි නීතිපතිවර ඩොන් ලැන්ස්ටන් මහත් අපහසුතාවයකට පත් කෙළේ ය. මෙය දුටු ත්‍රිපුද්ගල විනිශ්චය මණ්ඩලයේ විනිසුරුවරු අතුරින් අර්ල් වොරන් නම් විනිසුරුවරයා තිසි තැන බලා 'හොඳයි ජ්‍යාමිතිය විෂය ඉගැන්වීම පැසල්වල තහනම් කළොත් ඇති වන තත්වය කුමක්ද?' යි නීතිපතිවරයාගෙන් ප්‍රශ්න කෙළේ විහිළුවක් වගේ ම එතෙක් වර්ධනය කරගෙන ආ පැමිණිල්ලේ තර්කයට රුකුලක් දෙන අයුරිනි ! තවත් විනිසුරුවකු වූ ස්ටුවට්ට ද එහි දී නිකං බලා ඉන්නට බැරි විය. මද සිනහවක් මුව'ගට නගාගත් ඔහු ද 'ඇයි ලෝකය ගෝලාකාරයි යන මතය වෙනුවට එය හතරැස් යැයි පාසල්වල උගන්වන්නට කීවොත් කොහොම ද?" යයි ඇසුයේ මුළු අධිකරණ ශාලාව ම සිනහගන්වමිනි. පරිණාම වාදය පිළිබඳ ව පුරා සියවසක කාලයක් තිස්සේ අමෙරිකාව පුරා පැවති වාද විවාද මෙම නඩුව ආරම්භ වී පැය භාගයකින් නිමාවට පත් විණ.

විනිශ්චය මණ්ඩලයේ තීරණය කුමක්දැයි දැන් සඳහන් නොකළත් ඒ කෙබඳු එකක් දැයි සිතා ගැනීමට විනිසුරුවරුන් දෙදෙනෙකු කළ ඉඟිවලින් ඒ මොනවට පැහැදිලි විය යුතු ය. ඩාවින් බේරා ගැනීමට මෙම තරුණ ගුරුවරියට 1968 දී මෙසේ හැකි විය. එසේ වුවද මීට ඉහත සියවසක් තුළ ම ඩාවින් සහ ඔහුගේ පරිණාමවාදය මුහුණ දුන් තින්ද අපහාස අපමණ ය. නඩුපිට නඩු පවරා වුව ද ඒ නින්ද අපහාසවලින් මිදීමට ප්‍රතිගාමී බලවේග ඉඩ නොදුන්නේ ය. යටත් පිරිසෙයින් නිර්මාණවාදය ගැන සඳහනක් නොකර, සිය වාදය ඉදිරිපත් කළ ග්‍රන්ථය වූ 'The Origin of Species' (ජීව විශේෂවල සම්භවය) පළ කිරීමටවත් ඔහුට ඉඩ නොලැබිණ. එහෙයින් ම ය ඔහුට සිය ග්‍රන්ථයේ අවසාන ඡේදයේ අවසාන වැකිය වශයෙන් "There is grandeur in this view of life, with its several powers, Having been originally breathed by the Creator in to a few forms or in to one, and that, whilst this Planet has gone cycling on according to the fixed law of gravity, form. So simple a beginning endless forms most beautiful and most wonderful have been, and are being evolved." (p 450-A Mentor Book-1st Edition)

ගුරුත්වාකර්ෂණ නියමය අනුව මෙම ග්‍රහලෝකය පරිභ්‍රමණය වෙමින් යද්දී, ඉතා සරල වූ ස්වරූපයකින් ආරම්භ වී ඉතා අලංකෘත සහ විස්මය ජනක

අනන්ත වූ ස්වරූප විකාශනය වී දියුණු විකාශනය වෙමින් පවතින, සර්වබලධාරී දෙවියන් විසින් ජීව වායුව පිඹින ලද, බොහෝ ශක්තීන් ගෙන් අනූන මෙම ජීව දර්ශනයෙහි මහත් ආශ්චර්යයක් ඇත්තේ ය.' සඳහන් කිරීමට චාර්ල්ස් ඩාවින්ට එදා සිදු විණ.

1870 ගණන්වල යුරෝපය පුරා වර්ධනය වෙමින් පැවැති මතවාද දෙකක් රෙපරමාදු නායකයන් ගේ උකුසු ඇසට ලක් විය. ඉතිහාසයේ කිසිදක නොවූ විරූ ගැඹුරින් බයිබලය විශ්ලේෂණය කිරීමට සමකාලීන උගතුන් දැරූ උත්සාහය ඉන් එකකි. ඔවුන් ගේ අදහස වූයේ ඈත අතීතයේ සිට ක්‍රිස්තියානිවරුන් විසින් විශ්වාස කරගෙන ආ පරිදි බයිබලය හුදෙක් අවිචාරයෙන් තොර ව විශ්වාස කටයුතු දේවභාෂිතයක් නොවන බවයි. බයිබලය පිළිබඳ මධ්‍යස්ථ මතධාරීහු එය ආගමික ග්‍රන්ථයකට වඩා පැරණි මිත්‍යා විශ්වාස, ඉතිහාසය, නීතිය, දර්ශනය, දේශනා සහ කාව්‍ය අඩංගු ශාස්ත්‍රීය ග්‍රන්ථයක් වශයෙන් සලකන්නට පුරුදු වූහ. යුරෝපයේ වර්ධනය වූ අනෙක් මතවාදය නම් මිනිසා පරිණාමය වී ඇත්තේ, රිළා, වඳුරු වැනි වානර අශ්‍රේශ විශේෂයකින් බව කියන, ඉංග්‍රීසි ජාතික චාර්ල්ස් ඩාවින් ගේ පරිණාම වාදයේ ස්වභාවික වරණ වාදය (Natural Selection) යි.


ජීව සම්භවය සහ පරිණාමය ගැන, ක්‍රිස්තෝදයට පෙර හය වැනි සිය වසේ විසූ මිලිටස් හි ඇනක්සිමැන්ඩෙස් ගේ කාලයේ පටන් උගතුන් ගේ අවධානය යොමු වී තිබිණ. ප්‍රංශ ජාතික ජීන් බැප්ටිස්ට් ඩි ලැමාර්ක් 1809 දී 'පරිචිත ලක්ෂණ උරුම වාදය' (Theory of inheritance of acquired character-s) නමින් ජීව පරිණාමය පිළිබඳ ව විද්‍යාත්මක න්‍යායයක් ඉදිරිපත් කළ මුල්ම විද්‍යාඥයා විය. චාර්ල්ස් ඩාවින් සිය පරිණාම වාදය ඉදිරිපත් කෙළේ ඊට වසර 50 කට පසු, 1859 දී ය. ඩාවින් සිය මතය සනාථ කිරීමට සාධක රැසක් ම ඉදිරිපත් කළා පමණක් නොව එසේ පරිණාම වූයේ ඇයිද යන්නත් පැහැදිලි කිරීමට උත්සාහ ගත්තේ ය. ජීවත්වීමේ සටන (Struggle for existance) ස්වභාවික වරණය (Natural Selection) සහ උච්චතෝත්තතිය (Survival of rhe Fittest) යන සිද්ධාන්ත ඔහු සිය ග්‍රන්ථයෙන් අවධාරණය කෙළේ ය. ඊ අතරින් උච්චතෝත්තතිය හුදෙක් ඩාවින් ගේ පරිණාම වාදයේ විශේෂත්වය පැහැදිලි කරන ලක්ෂණයක් විය. සැබැවින් ම පරිණාම වාදය නොහොත් 'ඩාවින් වාදය' යනුවෙන් හැඳින්වෙනුයේ ද එයයි.

ඉහත සඳහන් කළ පරිදි ඩාවින් ගේ පරිණාම වාදයට තිරිඹගෙයි දී ම වූ බලපෑම් ඉන්පසුවත් කෙරෙන්නට විය. විශේෂයෙන් ම දහනව වැනි සියවසේ අග කාර්තුවේ දී ඩාවින්වාදය ගතානුගතික ආගමික නිකායන් තුළ මහත් කැළඹීමකට තුඩුදුන් විෂයක් විය. එහි ප්‍රතිඵලය වූයේ දේවවාදීන් ගේ අයෝමය හස්තයට හසුවූ ඩාවින් වාදීන්ට විවිධ හිරිහැරවලට මුහුණදීමට සිදුවීම යි. නිකායන් තුළ වූ එවැන්නෝ ධර්මාස්ථානවලින් නෙරපනු ලැබූහ. විද්‍යාපීඨවල වූවන්ට ඩාවින් මතවාද ඉගැන්වීම නොකළ යුතු යැයි තරවටු කළ අතර ඊට කීකරු නොවූවෝ විද්‍යාපීඨ තුළින් එළියට විසිවූහ. ඉන් ද නොනැවතුණු ඔවුහු බයිබලයේ පැරණි තෙස්තමේන්තුවේ ප්‍රථම කාණ්ඩය වන 'ජෙනිසිස්' (Genesis) හි සඳහන් නිර්මාණ සංකල්පය මතුකොට ආදම්, ඒව සහ සර්පයා පිළිබඳ කතාව දේව භාෂිතයක් වශයෙන් විශ්වාස කළ යුතු බවට 1895 දී පැවැති නයගරා-බයිබල් සම්මන්ත්‍රණයේ දී සම්මත කැරගත්හ. තත්ත්වය උග්‍ර ස්වරූපයකට හැරීමට මෙම සම්මතය ඉවහල් විය. එතැන් සිට මෙතෙක් නිර්මාණවාදයත්, ඩාවින්වාදයත් අතර වූ අදෘශ්‍යමාන ගැටුම සෘජු, පැහැදිලි එකක් බවට පත් විණ.

නයගරා-බයිබල් සම්මන්ත්‍රණයේ සම්මතයෙන් ක්‍රියාත්මක කිරීමට ස්ටුවර්ට් නම් කෝටිපති පවුලක ලේමන් සහ මිල්ටන් නම් සහෝදරවරු දෙදෙනා 1907 දී ඉදිරිපත් වූහ. ඔවුහු ප්‍රකාශන කිහිපයක් ම පළකොට එය ව්‍යාපාරයක් හැටියට ගෙන ගියහ. පසුව මූලධර්මවාදය (Fundmentalism) නමින් ප්‍රකට වූයේ මෙම ව්‍යාපාරය යි. කල්යත් ම ආදම්වාදීන් (Adamists) නමින් ද ප්‍රකට වූ මෙම මූලධර්මවාදී ව්‍යාපාරය 2 වැනි ලෝක සංග්‍රාමයෙන් පසු අති සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන්නට විය. වරක් අමෙරිකාවේ රාජ්‍ය ලේකම්වරයාව සිටි විලියම් ජෙනින්ස් එහි ප්‍රබල පුරෝගාමියකු විය. නීතිවේදියකු, කථිකයකු, ආගමික දේශකයකු පමණක් නොව ජනාධිපති අපේක්ෂකයකු ද වූ ජෙනින්ස් ට මූලධර්මවාදය ව්‍යාප්ත කිරීමට තරම් ප්‍රමාණවත් අත්දැකීම් තිබිණ. ඔහුගේ ක්‍රියාකාරිත්වය කොතරම් ප්‍රබල විද යත් අමෙරිකාවේ ඇතැම් ජනපදවල පරිණාමවාදය ඉගැන්වීම තහනම් කෙරෙන නීති සම්පාදනය දක්වා සිය බලපෑම් කිරීමට ඔහු සමත් විය.

මෙහි පළමුවැන්න 1925 දී ටෙනිසි ජනපදයෙන් ආරම්භ විය. ජෝන් වොෂින්ටන් බට්ලර් විසින් එම වර්ෂයේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට ඉදිරිපත් කළ පරිණාමවාදය පාසල්වල ඉගැන්වීම තහනම් කෙරෙන පනත එදා වැඩි වාද විවාදයකින් තොරව අනුමත වී, 1925 මාර්තු 21 වැනි ද ආණ්ඩුකාරවරයා විසින් අත්සන් තබන ලදී. 'බට්ලර් පනත' නමින් හැඳින්වුණු මෙය, මහජනයා තුළ මහත් නොසන්සුන්තාවයක් ඇති කිරීමට හේතුවිය. 'බට්ලර් පනතේ' ව්‍යවස්ථාමය අදාළත්වය උරගා බැලීමට පවරන නඩුවකට මූල්‍ය ආධාර දෙන බවට අමෙරිකාවේ

**ඩාවින් ගේ පරිණාම වාදයට තිරිඹගෙයි දී ම වූ බලපෑම් ඉන්පසුවත් කෙරෙන්නට විය. විශේෂයෙන් ම දහනව වැනි සියවසේ අග කාර්තුවේ දී ඩාවින්වාදය ගතානුගතික ආගමික නිකායන් තුළ මහත් කැළඹීමකට තුඩුදුන් විෂයක් විය. එහි ප්‍රතිඵලය වූයේ දේවවාදීන් ගේ අයෝමය හස්තයට හසුවූ ඩාවින් වාදීන්ට විවිධ හිරිහැරවලට මුහුණදීමට සිදුවීම යි.**



ඔස්තෙලෝපිතැකස් නම් වූ ප්‍රාථමික මිනිස් විශේෂය වර්තමාන මිනිසා ගේ ඈත නෑසියෝ ය.

සිවිල් නිදහස පිළිබඳ සංවිධානය Daily Times පුවත්පත මගින් ප්‍රකාශ කෙළේ එහි ප්‍රතිඵලයක් වශයෙනි.

මෙම ප්‍රකාශය පළ වූ දට පසු ද ගිනිකොණදිග ටෙනිසියේ ඩේටන් නම් කුඩා නගරයේ රොබින්සන්ස් ඩ්‍රග් ස්ටෝස් හි දී නව පනත පිළිබඳ කථාබහක් ඇති විය. කථාබහ ඇති වූයේ රියා හි ගැමි පාසල් අධිකාරිවරයකු වූ වොල්ටර් වයිට්, නීතිවේදියකු වූ සූ කේ. හිස් සහ ගල් අඟුරු ව්‍යාපාරයක් පවත්වාගෙන ගිය තරුණ නිව්යෝක් වැසියකු වූ ජෝර්ජ් ඩබ්ලිව්. රැපෙල්යා අතර ය. එය ක්‍රමයෙන් වාදයකට පෙරළිණි. ඩාවින්වාදියකු වූ රැපෙල්යා පනතට විරුද්ධ ව තර්ක කළ අතර අනෙක් දෙදෙනා ඊට පක්ෂව කරුණු දැක් වූහ. තිදෙනකු අතර අප්‍රසිද්ධියේ කෙරෙන වාදයකින් වැඩක් නොවන බව පෙන්වා දුන් රැපෙල්යා සිවිල් නිදහස් සංවිධානයෙන් ප්‍රකාශ කොට ඇති මූල්‍ය ආධාර ප්‍රයෝජනයට ගෙන නඩු මහට බසින ලෙසට අනෙක් දෙදෙනාට යෝජනා කෙළේ ය. ඔවුහු ඊට එකඟ වූහ. අමෙරිකාවේ කුඩා ඩේටන් නගරය මේ නඩුව නිසා ප්‍රසිද්ධියට පත්වන බවත්, තමා පැරදුන හොත් පනත ඉල්ලා අස්කරගැනීමට රජයට බල කළ යුතු බවත් රැපෙල්යා කී අදහසට අනෙක් දෙදෙනා ද කැමැති වූහ.

නඩුවේ විශේෂත්වය වූයේ විත්තිය වශයෙන් පරිණාමවාදී පාර්ශවය ඉදිරිපත්වීම ය. පාසලක පරිණාමවාදය ඉගැන්වූයේ යැයි වූ මතඃකල්පිත චෝදනාවක් ලැබීමට ඔවුන්ගේ මිතුරෙකු වූ 24 හැවිරිදි ජෝන් තෝමස් ස්කෝප්ස් මේ සඳහා ඔවුහු විත්තිකරු වශයෙන් යෙදවූහ. එසේ ම අවශ්‍ය මූල්‍යාධාර ද සිවිල් නිදහස පිළිබඳ සංවිධානයෙන් නඩුව සඳහා නිදහස් කරන ලදී. නව ද මූලධර්ම ව්‍යාපාරයේ සංවිධායකයා වූ විලියම් ජෙනින්ස් බ්‍රයන් පැමිණිලිකරු ලෙසට ඉදිරිපත්වන සේ කැමැතිකරවා ගත්හ. අමෙරිකාවේ දක්ෂ ම නීතිවේදියකු වූ ක්ලැරන්ස් ඩරෝ ගාස්තුවක් රහිතව විත්තිය වෙනුවෙන් පෙනී සිටීමට ඉදිරිපත් වූ අතර දෙපාර්ශවයට ම බොහෝ නීතිවේදීහු නොමිලේ සහයෝගය දීමට ඉදිරිපත් වූහ.

රැපෙල්යා කියූ පරිදි ම ඩේටන් නම් වූ ඒ කුඩා නගරය මුළු අමෙරිකාවේ ම ප්‍රසිද්ධ වන්නට විය. පරිණාමවාදය පිළිබඳ නඩු විභාගය නැරඹීමට එදා විශාල ජනකායක් අධිකරණයට රොක් වූහ. ජනමාධ්‍යවේදීන් පමණක් 100 කට අධික විය. 1927 ජූලි 10 වැනි ද ප්‍රාදේශීය ව පැවැති වියළි කාලගුණය මැද නඩු විභාගය ආරම්භ විය.




ඩාවින් (දකුණේ) ගේ පරිණාම වාදය ගෝරිල්ලා ගේ දුකට හේතු වී ඇති සෙයකි. (1871 විකට චිත්‍රයකි)

**"මේ නීතිඥයාගේ පරමාර්ථය බයිබලය අවමානයට ලක් කිරීම යි" අනතුරුව ඔහු ගිගුරුවේ ය. ඩරෝ ද පෙරළා ගිගුරුවේ ය. කොයිවේලේ දෙදෙනා අතර ගුටිකෙළියක් ඇති වේ දැයි වික්ෂිප්තව මුළු අධිකරණය ම බලා සිටියහ.**

පරිණාම වාදයට පාක්ෂික ව කරුණු ඉදිරිපත් කොට ඩාවින් ආරක්ෂාකැර ගැනීමට අවශ්‍ය සාක්ෂිවලින් විත්තිය සන්නද්ධ ව සිටියේ ය. ඒ සඳහා ඔවුහු මහාචාර්යවරුන් ඇතුළු ජීව විද්‍යාව පිළිබඳ උගතුන් රැසක් ම අධිකරණයට කැඳවා සිටියහ. විත්තියේ පරමාර්ථය වූයේ රැවුලත් කැඳත් බේරාගැනීම ය. එනම් පාසල්වල පරිණාමවාදය ඉගැන්වීමත්, ආගමික ග්‍රන්ථය වන බයිබලය ඉගෙනීමත් අතර කිසිම අවස්ථාවක මත ගැටුමකට හේතු නොවන බව පෙන්වාදීම ය. මේ ඔස්සේ කරුණු ඉදිරිපත් කිරීම කෙරීගෙන යන අතරතුර පැමිණිල්ල ඊට හරස් විය. විනිසුරු අසුනේ හිටියේ රාහුල්සන් නම් මූලධර්මවාදියෙකි. ඔහු වහාම ඒ හරස්වීමට ඉඩ දුන්නේ ය. එසේ වුව ද ඔහු සාධාරණ නඩු විභාගයක් පැවැත්වීමට උත්සාහ ගත් බැව් කියනු ලැබේ. කෙසේ වුව ද විද්‍යාත්මක සාක්කි ඉදිරිපත් කිරීම තහනම් කිරීම විත්තියේ තර්කවල මුල සිඳීමක් බවට පත්වීම විත්තියට අවාසිදායක විය.

විත්තිය වෙත වූ ප්‍රබල ම ආයුධය වූ විද්‍යාත්මක සාක්ෂි තහනම් වීමෙන් ඇති වූ අවදානම හඳුනාගත් නීතිවේදී ඩරෝ කෙළින් ම පැමිණිලිකරු වූ බ්‍රයන් සාක්ෂි කූඩුවට නැංවීමට තීරණය කෙළේ ය. එදා ඔහුගේ එම සාක්ෂි විභාගය එකම ශාස්ත්‍රීය විග්‍රහයක් විය. ඔහු බයිබලයත්, මිනිස් ශිෂ්ටාචාරයත් නවීන විද්‍යාවේ අද්‍යතන බලපෑමත් ආදී විෂයයන් රැසක් ම ඔස්සේ බ්‍රයන් ගෙන් දිගින් දිගටම ප්‍රශ්න කෙළේ ය. අන්තිමේදී ඔහුගේ ප්‍රශ්න බ්‍රයන් හාස්‍යයට ලක්කරන ඒවා විය. බයිබලය ගැන ප්‍රශ්න කළ ඔහු 'ජුවානා තල්මසා විසින් ගිලිනු ලැබුවාද? පොළොවේ අක්ෂ භ්‍රමණය ජොසුවා විසින් නැවැත්වූවා ද? කේන් සිය බිරිය ගත්තේ කොහෙන් ද?' ආදී ප්‍රශ්න පවා ඇසුයේ ය. උසාවි ශාලාව සිනහවෙන් පිරීයන්නට යූ අතර බ්‍රයන්ට හීන් දඩිය දැම්මේ ය. මේ ප්‍රශ්න කිසිවකටත් පිළිතුරු ඔහු වෙත නොවී ය. මේ අයුරින් ඩරෝ බ්‍රයන් ව පැය 1 1/2 ක් සාක්ෂි කූඩුව තුළ තබා ගැනීමට සමත් විය. බයිබලයේ කියැවෙන හැටියට පොළොව වසර දහස් ගණනක් නොව දශ කෝටි ගණනක් පැරණි බව විශ්වාස කරවන තැනට ඔහු බ්‍රයන් ගෙන ආයේ ය. අන්තිමේ දී ඔහු 'තමා බයිබලය ගැනවත්, පරිණාමය ගැනවත් මේ ලෝකේ කිසිම දෙයක් ගැනවත් දන්නෙ නැ කියල මම කියනව' යනුවෙන් සාක්ෂිකරුට යෝජනා කෙළේ ය. ඒ විතරක් නොව බ්‍රයන් සිය සංවිධානයෙන් දේශනා කරන කිසිම දෙයක් ගැන හරි අවබෝධයක් ඔහුට නැති බව ද ඩරෝ කියා සිටියේ ය. මෙසේ සිය නිගමනය දීමෙන් පසුව වුව ද නිහඬව නොසිටි ඩරෝ හොඳයි සර්පයාට බඩගා යන ලෙසට දෙවියන් කියන්නට පෙර ඒ සර්පයා ගියේ කොහොම ද? වල්ගය බිම ඇණ පැන පැන ගියා ද? යනුවෙන් ඇසී ය. මුළු අධිකරණය ශාලාව පුරාම උස් සිනාවක් පැතිර ගියේ ය. බ්‍රයන් සාක්ෂි කූඩු රාමුවට මිටින් වේගවත් පහරක් දී නැඟී සිටියේ ය.

"මේ නීතිඥයාගේ පරමාර්ථය බයිබලය අවමානයට ලක් කිරීම යි" අනතුරුව ඔහු ගිගුරුවේ ය. ඩරෝ ද පෙරළා ගිගුරුවේ ය. කොයිවේලේ දෙදෙනා අතර ගුටිකෙළියක් ඇති වේ දැයි වික්ෂිප්තව මුළු අධිකරණය ම බලා සිටියහ. මේ අතර සිය මිටිය වරින් මේසය මත හෙළූ විනිසුරුවරයා එදින නඩු විභාගය එතෙකින් අවසන් කෙළේ ය.

21 වැනි ද යළි රැස් වූ අධිකරණයේ කටයුතු ආරම්භ වූයේ විනිසුරුවරයා මූලධර්මවාදියකු බව සනාථ කරමිනි. එනම් ඉකුත් ද ඩරෝ සහ

බ්‍රයන් අතර වූ සංවාද නඩුපොතින් කපා හරිමිනි. අධිකරණ ශාලාවට වඩා බැහැර වැඩිවෙලා ගතකොට තුබූ ජූරි සභාව කැඳවීමට ඔහු තීරණය කෙළේ ය. විත්තියේ නීතිවේදියා වූ ඩරෝට අවශ්‍යව තිබුණේ මෙම නඩුව දිනීමට වඩා පරිණාමවාදය පිළිබඳ ව මහජනයා දැනුවත් කිරීමට ඉඩකඩ ලැබෙන සේ නඩුව දීර්ඝගැසීම ය. එහෙයින් මෙහි දී නැගී සිටි ඔහු විත්තිකරු වරද පිළිගන්නා බව ප්‍රකාශ කොට සිටියේ ය. එයින් ඔහු අදහස් කෙළේ විත්තිකරු වරදකරු කිරීමෙන් පසු මහාධිකරණයට අභියාචනා කොට තවත් කලක් නඩුව සමග ගත කිරීම යි. එය ඒ අකාරයෙන් ම සිදුවීමට ඉඩ සැලසෙන සේ ඩොලර් 100 ක් දඩයක් විත්තිකරු වූ ස්කෝප්ස්ට නියම කළ විනිසුරු නඩුව අවසන් කෙළේ ය.

එහෙත් අභියාචනයේ දී හාස්‍යයට ලක්වීමට බ්‍රයන් නොසිටියේ ය. ඒ නඩු තීන්දුවෙන් පස් දිනකට පසු රෑ නින්දේදී ම ඔහු මියගොස් සිටි බැවිනි. විත්තිකරු වූ ස්කෝප්ස් චිකාගෝ විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂකයකු ලෙසට ලියාපදිංචි විය.

නීතිවේදී ඩරෝ බලාපොරොත්තු වූ පරිදි ම නඩුව අභියාචනාධිකරණය හමුවේ තැබ ය. එය විභාගය සඳහා උත්සාහ නොගත් අභියාචනාධිකරණයේ විනිසුරුවෝ එම නඩුව දීර්ඝගැස්සීමෙන් විත්තියේ නීතිවේදියා අදහස් කරන දේ ඉවෙන් මෙන් දැනගෙන දේ මෙවැනි නඩුවක් දීර්ඝගැස්සීමෙන් රජයට විශේෂ ලාභයක් නොලැබෙන බව සඳහන් කරමින් විත්තිකරුට පැනවූ දඩුවම ඉවත් කොට ඔහු නිදහස් කොට හරින මෙන් නිර්දේශ කොට නඩුව පහළ අධිකරණයට යොමු කෙළේ ය. 1927 ජනවාරි 27 වැනිදා ඒ අනුව විත්තිකරු නිදහස් කෙරුණු අතර ඩාවින්ට සිදුවී ඇති අසාධාරණය හමුවේ අධිකරණ සංකේතයෙන් දක්වන පරිදි ම නීතිය අන්ධ බව සනාථ වුණේ ය.

'ස්කෝප්ස් ගේ නඩුව' කෙරෙ අධිකරණය දැක් වූ මේ අන්ධභාවය, ටෙනිසි ජනපදයේ පමණක් නොව අමෙරිකාවේ සෙසු ජනපද පුරා ද, ඩාවින් විරෝධී රැල්ල හමා යාම හේතු විය. ආදම්වාදී සංගම් හතු පිපෙන්නාක් මෙන් බිහිවන්නටත් පරිණාමවාද උගන්වන ගුරුවරුන් මර්දනය කිරීමටත් ඉන් තව තවත් වාතාවරණයක් ඇතිවන්නට විය. ටික දිනකින් 'බට්ලර් පනතට' සමාන පනතක් මිසිසිපි ජනපදයේ ද සම්මත කරගන්නා ලදී. ඒ අතර පරිණාමය පිළිබඳ තොරතුරු උපායශීලීව පාසල් විෂය මාලාවලින් බැහැර කරන ලෙසට බොහෝ ජනපදවල අධ්‍යාපන බලධාරීන් වෙත බලපෑම් එල්ල වන්නට විණ. මෙසේ වර්ධනය වූ රැල්ල කුළුගැන්වුණේ මුලදී සඳහන් කළ ආකන්සාස් ජනපදයේ අනුමත කරගත් 'රොටෙන්බෙරි' පනතිනි.

**'ස්කෝප්ස් ගේ නඩුව' කෙරෙ අධිකරණය දැක් වූ මේ අන්ධභාවය, ටෙනිසි ජනපදයේ පමණක් නොව අමෙරිකාවේ සෙසු ජනපද පුරා ද, ඩාවින් විරෝධී රැල්ල හමා යාම හේතු විය. ආදම්වාදී සංගම් හතු පිපෙන්නාක් මෙන් බිහිවන්නටත් පරිණාමවාද උගන්වන ගුරුවරුන් මර්දනය කිරීමටත් ඉන් තව තවත් වාතාවරණයක් ඇතිවන්නට විය.**

එදා ඒ 'රොටෙන්බෙරි පනත' සාමාන්‍ය නෛතික ක්‍රියාවලිය තුළින් අනුමතකරගත නොහැකි විණ. එහෙත් ජනමතවිචාරණයකින් ඉතා අමාරුවෙන් එය අනුමත කැර ගැනීමෙන් පෙනීගියේ මිනිසුන් ගේ ආකල්පවල ක්‍රමික වෙනසක් ඇතිවෙමින් එන බවයි. සැබැවින් ම මේ කාලය වන විට මූලධර්මවාදීහු ශීඝ්‍ර පසුබෑස්මකට හසුවී සිටියහ. මෙහිලා ක්‍රියාකාරී වූ මූලික හේතුවක් සේ දැකිය හැක්කේ ජීව විද්‍යාව, භූගර්භ විද්‍යාව සහ ප්‍රාග් ඓතිහාසික සොයාගැනීම් පිළිබඳ පතපොත යුරෝපාකරයෙන් විත් අමෙරිකාව පුරා ව්‍යාප්තවීම යි.

එහෙත් අමෙරිකාව පුරා ජනපදවල අනුමත කොට තුබූ ඩාවින් විරෝධී පනත්වල නෛතික වලංගුතාව අවසන් කිරීමට බොහෝ උගතුන්ට ඕනෑ වී තිබිණ. රොටෙන්බෙරි පනතට විරුද්ධව අමෙරිකාවේ මහාධිකරණයේ පවරා තුබූ නඩුව එහි ප්‍රතිඵලයකි. විනිසුරුවන් තිදෙනෙකු හමුවේ විභාග වූ මෙම නඩුවේ තීන්දුව 1968 නොවැම්බර් 12 වැනිදා ප්‍රකාශයට පත් කරන ලදී.

විනිසුරු බ්ලැක් ගේ මතය වූයේ පනත නොපැහැදිලි හෙයින් එහි නෛතික වලංගුතාව දුර්වල බව යි. විනිසුරු මාර්ලන් ද එම මතය ම සනාථ කරමින් පනතේ නොවැදගත් බව ද අවධාරණය කෙළේ ය. තෙවැනි විනිසුරු වූ ස්ටුවර්ට් ගේ මත වූයේ ප්‍රජාතන්ත්‍රික සමාජයක් තුළ, කිසියම් මතයක් ප්‍රකාශ කළ පමණින් හෝ, යම් මතයකට අනුකූලතා දැක්වූ පමණින් හෝ දණ්ඩනීති සංග්‍රහය අනුව අපරාධකරුවකුට දෙන දඬුවම් පැනවීම පුද්ගලයකුට එවැනි සමාජයක ඇති කථාකිරීමේ නිදහසේ වරප්‍රසාදය උල්ලංඝනය කිරීමක් බව යි.

ඒ අනුව 'රොටෙන්බෙරි පනත' ව්‍යවස්ථා විරෝධී පනතක් බව අමෙරිකාවේ මහාධිකරණය 1998 නොවැම්බර් 12 වැනිදා තීරණය කෙළේ ය.

සියවසක් පුරා පැවැති, 'වානර හටන' නමින් බොහෝ විට හැඳින්වුණු, පරිණාමවාදී අරගලය මෙසේ එදා අවසන් වුවත් තවත් කලක් ගත වන තුරු ම එහි හිස එසවීම් වරින්වර දෘශ්‍යමාන විය. නෛතික වශයෙන් හෝ, සමාජමය වශයෙන් හෝ ඩාවින් ගේ පරිණාම වාදය යටපත් කළ නොහැකි වූ තැන, එය කරුණු වශයෙන් නොව න්‍යායික වශයෙන් පාසල්වල ඉගැන්විය යුතු යැයි යන හාස්‍යජනක ප්‍රකාශ ඇතැම්විට කැර ඇති බව පෙනේ. කැලිෆෝනියා ජනපදයේ සිටි ආන්ඩුකාර රිගන් ගේ ප්‍රකාශය එවැනත්තකි. අද්‍යතන යුගයේ අප ලබා ඇති දැනුම් සම්භාරය අනුව, එය හරියට ම මිනිසා හඳට ගිය බව කරුණු වශයෙන් නොව න්‍යායක් වශයෙන් පාසල්වල ඉගැන්වීම යෝග්‍යයි යන ප්‍රකාශයට නොදෙවැනි ය.

**(L. ස්ප්‍රගු ඩී. කැම්ප් ගේ 'The Great Monkey Trial' ග්‍රන්ථය ඇසුරිනි.)**

## තුන් වරම

කාන්තාරයේ අතරමංවුණු මිනිසුන් තිදෙනකු හට වැලි කන්දක් යට තිබී ලාම්පුවක් ලැබුණි. ඔවුන් ලාම්පුව පිරිමදින් ම ඒ තුළින් භූතයෙක් මතුවූයේ ය.

“මං ඔබලා තිදෙනාට වරම් තුනක් දෙනවා”, භූතයා පැවසුවේ ය.

“මට මගේ ගෙදරට යන්ට ඕන.”

පළමු මිනිසා පැවසුවේ ය. සැනෙකින් ඔහුට එම වරම ලැබුණි.

“මටත් මගේ ගෙදරට යන්ට ඕන”

දෙවැනි මිනිසා පැවසුවේ ය. සැනෙකින් ඔහුට ද එම වරම ලැබුණි.

තනිවුණු තුන්වැන්නා, මොනවා ඉල්ලිය යුතුදැයි කල්පනා කරමින් සිටියේ ය. භූතයට කේන්ති ගියේ ය.

“ඉක්මනට ඉල්ලනවා. මටත් වැඩ තියෙනවා.” භූතයා ගෙරෙව්වේ ය.

“අනේ මට තනියම මෙහේ ඉන්ට බෑ. මට මගේ යාළුවන් දෙන්නා ඕනෑ.”

ඔහුගේ වරම ද ඉටුවුණි.

රචනය :— මැට් රිසින්ග

## කුඩේ ගත්තාම හරිනේ !

වැස්ස තදින් ම වැටෙන්නට පටන්ගත් කල්හි, සුමා දෙයක් ම අමතකවන මහාචාර්ය තුමා මිදුලට බැසීමට සූදනම් වූයේ ය. ඔහුගේ බිරිඳ ඔහුට කතා කළා ය.

“ඔබ කොහාටද මේ යන්ට හදන්නේ?”

“මල් වලට වතුර දාන්ට”

මහාචාර්යතුමා උත්තර දුන්නේ ය.

“පෙන්නේ නැද්ද හොඳට ම වහිනවා”

ඔහුගේ බිරිඳ පැවසුවා ය.

“ඔබ හරි”

මහාචාර්යතුමා පැවසුවේ ය.

“කුඩේ අරන් ගියා ම හරිනේ.”

රචනය :— පිලිප් යේට්ස්
අනුවාදය :— පරාක්‍රම ඇස්. විජේවර්ධන